# තනතුරු ඇබෑර්තු

## ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය

වැව්ලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

මෙම ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකිකයන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. පුහුණු කිරීමේ නිලධාරි (වැව්ලි ඉංජිනේරු) - JM 1.1 (II ශ්‍රේණිය)**

රැකියා විස්තරය : විෂයානුබද්ධ දේශන පැවැත්වීම, පුහුණු විශේෂඥයින්ට පැවරී ඇති රාජකාරි ඉටු කිරීමට පුහුණු විශේෂඥයින්ට සහාය වීම, පුහුණු විශේෂඥයින්ගේ මගපෙන්වීම යටතේ පුහුණු පාඨමාලා සහ අදාළ අත්පොත් සැලසුම් කිරීම, කර්මාන්තය සඳහා සුදුසු පුහුණු වැඩසටහන්/ පාඨමාලා සැලසුම් කිරීම්, සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම, අධ්‍යයන බලපෑම් අගැයීම් සහ පුහුණු වැඩසටහන්/ පාඨමාලා, අගැයීම් වාර්තා, මූල්‍ය ප්‍රතිලාභ සහ අනෙකුත් අදාළ සංඛ්‍යාලේඛන පිළියෙල කිරීම, පුහුණු විශේෂඥයින් / කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කිරීම.

සුදුසුකම් : **බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2 හෝ 3)**

1. වැව්ලි ඉංජිනේරු විද්‍යාව, කෘෂිකර්මය (කෘෂි ඉංජිනේරු විශේෂිත), කෘෂි විද්‍යාව, කෘෂි තාක්ෂණය, වැව්ලි බෝග තාක්ෂණය (වැව්ලි ඉංජිනේරු විද්‍යාව විශේෂිත) යන ක්ෂේත්‍රයන්හි උපාධිය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම;

2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ විෂයය ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට වඩා නොඅඩු සහතිකය ලබා තිබීම සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව සංස්ථා/ මණ්ඩල හෝ ව්‍යවස්ථාපිත ආයතනයක විෂයය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්ද;

3. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ විෂයය ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට වඩා නොඅඩු සහතිකය ලබා තිබීම සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව සංස්ථා/ මණ්ඩල හෝ පිළිගත් ව්‍යවස්ථාපිත ආයතනයක විෂයය ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර දහයක (10) සේවා පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම,

වැටුප් පරිමාණය : JM 1.1 - රු. [72,650-10x1,360-18x2,040= රු. 122,970/-]
(ආරම්භයේ දී රු. 65,633/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ).

වයස් සීමාව : වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

බඳවා ගැනීමේ ක්‍රමවේදය : ලිඛිත තරඟකාරි විභාගයක් සහ / හෝ වෘත්තීය වේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**2. පුහුණු කිරීමේ නිලධාරි (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ) තනතුර - JM 1.1 (II ශ්‍රේණිය)**

රැකියා විස්තරය : විෂයානුබද්ධ දේශන පැවැත්වීම, පුහුණු විශේෂඥයින්ට පැවරී ඇති රාජකාරි ඉටු කිරීමට පුහුණු විශේෂඥයින්ට සහාය වීම, පුහුණු විශේෂඥයින්ගේ මගපෙන්වීම යටතේ පුහුණු පාඨමාලා සහ අදාළ අත්පොත් සැලසුම් කිරීම, කර්මාන්තය සඳහා සුදුසු පුහුණු වැඩසටහන්/ පාඨමාලා සැලසුම් කිරීම්, සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම, අධ්‍යයන බලපෑම් අගැයීම් සහ පුහුණු වැඩසටහන්/ පාඨමාලා, අගැයීම් වාර්තා සකස් කිරීම, මූල්‍ය ප්‍රතිලාභ සහ අනෙකුත් අදාළ සංඛ්‍යාලේඛන, පුහුණු විශේෂඥයින් / කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කිරීම.

සුදුසුකම් : බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)

1. ගණකාධිකරණය/ මූල්‍ය/ ව්‍යාපාර කළමනාකරණය/ වාණිජ්‍යය යන ක්ෂේත්‍රයන්හි උපාධිය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම;

2. පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අදාළ විෂයය ක්ෂේත්‍රයේ අන්තර් මධ්‍ය විභාගය සමත්ව තිබීම,

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම,

2. අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත නිලධාරි මට්ටමේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා පළපුරුද්ද,

වැටුප් පරිමාණය : JM 1.1 - රු. [72,650-10x1,360-18x2,040=122,970/-]
(ආරම්භයේ දී රු. 65,633/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ).

වයස් සීමාව : වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

බඳවා ගැනීමේ ක්‍රමවේදය : ලිඛිත තරඟකාරි විභාගයක් සහ / හෝ වෘත්තීය වේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්,

**3. ගිණුම් සහකාර තනතුර - MA 3 (III ශ්‍රේණිය)**

රැකියා විස්තරය : ආයතනයේ ගිණුම්කරණ සහ මූල්‍ය කටයුතු සහතික කිරීමට ගණකාධිකාරීවරයාට සහාය වීම, ගිණුම් පොත් සහ ලේඛන පවත්වාගෙන යාම, කාලීන මූල්‍ය වාර්තා සහ ලේඛන සකස් කිරීමට සහාය වීම, ආයතනයේ පරිගණකගත ගිණුම් පවත්වාගෙන යාම, වැටුප් ගෙවීම චක්‍රලේඛවලට අනුකූලව සිදු කිරීම, නිසි ගිණුම්කරණ පද්ධතියක් පවත්වාගෙ යාම සහතික කිරීම සඳහා තත්ත්ව ප්‍රමිතීන් නිරීක්ෂණය කිරීම, ගෙවීම් කිරීමට පෙර අවශ්‍ය සියලුම ලියකියවිලි සමාලෝචනය කිරීම, ලේඛන සුරක්ෂිත කිරීම.

සුදුසුකම් : **බාහිර අයදුම්කරුවන් සඳහා**

ගිණුම්කරණය/ කළමනාකරණය/ වාණිජ්‍යය/ මූල්‍ය යන ක්ෂේත්‍රයන්හි උපාධිය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම ;

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

| | | |
|---|---|---|
| වැටුප් පරිමාණය | : | MA3 - රු. [53,940-10x800-11x1,190-10x1,320-5x1,350= රු. 94,980/-](ආරම්භයේ දී රු. 49,831/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාවලට හිමිකම් කියනු ලැබේ). |
| වයස් සීමාව | : | වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ. |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | : | ලිඛිත තරඟකාරී විභාගයක් සහ / හෝ වෘත්තීය වේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්. |

**පොදු කරුණු :**

උක්ත තනතුරු සඳහා තේරී පත්වන අයදුම්කරුවන් අදාළ රාජකාරි කටයුතු නිසි ලෙස ඉටු කිරීම සඳහා කායිකව මෙන් ම මානසිකව ද යෝග්‍ය විය යුතු අතර සේවා අවශ්‍යතාව මත ප්‍රධාන කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කටයුතු සිදු කිරීමට බැඳී සිටිය යුතු ය.

**අයදුම් කරන පිළිවෙල**

ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිත ඔබගේ සම්පූර්ණ ජීව දත්ත සටහන, අදාළ සහතිකවල පිටපත් සහිතව ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට **2026 අප්‍රේල් මස 22 දින** හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතු ය. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ ආයතනයේ ප්‍රධානීන් මගින් යොමු කළ යුතු වේ. **අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය.** අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිනම් තත්ත්වයක් යටතේ වුව ද භාරගනු නොලැබේ.

***සැලකිය යුතු යි :***

- වඩාත් ම සුදුසුකම් සපුරන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබනු ඇත.
- මෙම දැන්වීම www.nipm.gov.lk යන වෙබ් අඩවියේ ද පළකොට ඇත.

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරි,
ජාතික වැවිලි කළමනාකරණ ආයතනය.

2026 මාර්තු මස 09 දින,
ජාතික වැවිලි කළමනාකරණ ආයතනය,
එම්. ඩී. එච්. ජයවර්ධන මාවත,
අතුරුගිරිය.
දුරකථන අංකය : 011-2770232

04 - 130